සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) ප්‍රජා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් තුළ ප්‍රජාවගේ මානව හා භෞතික සම්පත් විශ්ලේෂණය කිරීම තුළින් සැලසුම් සකස් කිරීම සහ ඉලක්ක ලඟා කර ගැනීම;

(ආ) සංවර්ධන උපාය මාර්ග කාර්යක්ෂම කර ගනු පිණිස ප්‍රජාව සහ ප්‍රජා සංවිධාන දැනුවත් කිරීම, ශක්තිමත් කිරීම හා තහවුරු කිරීමට මැදිහත් වීම;

(ඇ) සංවර්ධන කටයුතු සඳහා මැදිහත් වීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන සමග මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම;

(ඈ) ප්‍රජාවට අවශ්‍ය ඔවුන් පිළිගන්නා, ඔවුන්ට දරාගත හැකි තිරසාර සංවර්ධන ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම;

(ඉ) සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා අවශ්‍ය සම්පත් යොදා ගැනීම, වර්ධනය කිරීම හා පවත්වාගෙන යෑම පිණිස ක්‍රියාත්මක වීම;

(ඊ) අදාළ ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල දී බර්ටි දිසානායක පදනමේ තාක්ෂණය, නියෝජනය හා දායකත්වය අවශ්‍ය තත්ත්වයක් බවට ගෙන ඒම;

(උ) බර්ටි දිසානායක පදනම තුළ ඵලදායීතාව, කාර්යක්ෂමතාව හා පිරිමැසීම පවත්වාගෙන යෑම; සහ

(ඌ) ඉහත කරුණු සාක්ෂාත් කර ගැනීම පිණිස පහත දැක්වෙන කරුණු යටතේ හා ඊට අදාළ වැඩසටහන් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම:—

(i) ළමා සහ යොවුන් (මාස 0 සිට අවුරුදු 18 දක්වා) සංවර්ධනය;

